## 02

# රජ කාලේ අවුරුදු

කෘෂිකර්මාන්තයෙහි යෙදෙන්නන්හට අප්‍රේල් මාසය හෙවත් බක් මාසය ඉතා වැදගත් වේ. මෙකල සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය ද යෙදේ. පෙර රජුන් දවස සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය රජයේ සහාය ඇති ව ම පැවැත්වීය. මේ සඳහා මාර්තු මාසයේ සිට ම කටයුතු සූදානම් කර ගනු ලැබිණ.

එහි දී රජ මාලිගාවේ සෑම ස්ථානයක් ම තොරණ බැඳ සරසයි . එම තොරණවල හරස් ලීවල කෙසෙල් කැන්, පොල් ගෙඩි ආදිය එල්ලනු ලැබේ. එසේ ම අනෙක් බොහෝ තැන්වල ද තොරණ වෙනුවට දිග රිටි සිටවනු ලැබේ. ඒවායෙහි නොයෙක් පාටින් කොඩි බැඳ, කුඩා මිණි ගෙඩි ද එල්ලනු ලැබේ.



එකල රජ වාසල ආහාර පිසීමට පෙර කටයුතු රැසක් ඉටු කිරීමට තිබිණ. ආහාර පාන සකස් කිරීම සඳහා සුවිශේෂ වෛද්‍යවරු කණ්ඩායමක් වූහ. ඔවුන්ගේ පළමු කාර්යය වූයේ අවුරුදු උදාවට පෙර හිස තෙල් ගෑම සඳහා ශාකමය ඖෂධ සකස් කිරීමයි. සකස් කළ මේ ඖෂධ මුට්ටිවල දමනු ලැබී ය. එම ඖෂධ මුට්ටි මහ පෙරහරින් රජ මාලිගාවට හා විහාරස්ථානවලට රැගෙන යාම සිරිතක් ව පැවතිණ.

අවුරුදු උත්සවයේ එක් එක් අවස්ථා සඳහා නැකත් වෙන් වෙන් ව සෑදිය යුතු විය. ඒ සඳහා රජ වාසලෙහි නැකත් සාදන්නෝ සිටියහ. ඔවුහු සියලු නැකත් සාද, සුදුසු පරිදි ඒ ඒ අයට කල් තියා දැනුම් දුන්හ.

අවුරුදු උදාව අප්‍රේල් මාසයේ දිනක සිදු විය. ඒ අප්‍රේල් 13 හෝ 14 වෙනි ද ය. එදින උදෑසන යුද සේනාව පේළි සෑදී රජ මාලිගාවට පැමිණෙති. හිමිදිරියේ අවදි වන රජතුමා නා, පිරිසිදු වී, රාජාභරණයෙන් සැරසී යුද සේනාව පරීක්ෂා කිරීමට මාලිගයෙන් පිට ව යයි. පළමු ව එතුමා සේනාවේ ආචාරය පිළිගනී. අනතුරු ව අවුරුදු නැකත උදාවීමේ සුබ මොහොතට පෙර සිංහාසනාරූඪ වෙයි.

රූමත් කාන්තාවෝ කිහිපදෙනෙක් දකුණතින් බුලත් ද, වමතින් කැකුළු හාල් දැමූ රිදී භාජන ද, කහ දියර ආදිය ද ගෙන රජතුමා ඉදිරියට පැමිණෙති. සුබ මොහොත උදාවෙත් ම රජතුමා තෙල් හා ඖෂධ යුෂ ටිකක් ගෙන තම හිසෙහි හා ශරීරයෙහි තවරා ගනී. ඊට පසු ව දෙපස සිටින කාන්තාවන් ද, මැති ඇමතිවරුන් ද රජතුමාට ආශීර්වාද කරන්නේ "දේවයන් වහන්ස, ඔබතුමා බොහෝ කලක් ජීවත් වේවා!" කියමිනි.

මෙදින රජතුමා වෙනුවෙන් විශේෂ භෝජනයක් පැවැත්වේ. එය "දින බෝජම" නම් වේ. එය සකසා ඇත්තේ ආහාර වර්ග කිහිපයක එකතුවකිනි. රජතුමා පළමු ව මෙයින් ස්වල්පයක් අනුභව කරයි. ඉන් පසු මැති ඇමතිවරුන් හා සේවකයන් ඇතුළු අනෙක් අයට එය බෙදා දෙයි. සමහර විට අවුරුදු උදාවත් සමඟ ම මෙම නැකත උදා වෙයි. විටෙක දී දින කිහිපයක ප්‍රමාදයක් වෙයි. මෙහි විශේෂත්වයක් තිබේ. එනම් මෙම නැකත යෙදෙන තුරු ගින්නෙන් පිසින ලද ආහාර අනුභව කිරීම තහනම් වීම ය.



අලුත් අවුරුද්ද ආරම්භයේ දී ම එන සුබ නැකත අනුව ගනුදෙනු කිරීම හා වැඩ ඇල්ලීම සිදු කෙරේ. රජයේ නිලධාරීහු තම තමන් අයත් වන නිලතල අනුව තෑගි රැගෙන රජතුමා හමුවීමට එති. එසේ ගෙන එන තෑගි අතර රන් ආභරණ, ලෝහ තැටි, අවි ආයුධ, වටිනා ඇඳුම්, මුතු මැණික් ආදිය ද වේ. මේ අවස්ථාවේ දී රජතුමා ද මේ පිරිසට තෑගි බෝග පිරිනමා, ගනුදෙනු කිරීමේ චාරිත්‍රය ඉටු කරයි. රජ වාසල නිලමේවරු එලෙස ලැබුණු ද්‍රව්‍ය ගබඩාවට එකතු කරති. රජ වාසලේ එක් රැස්වී සිටින අනෙක් පිරිස ද එකිනෙකා අතර බඩු මුට්ටු, තෑගි බෝග හුවමාරු කර ගනිති.

අලුත් අවුරුද්දේ දිය නෑම ද, නැකතට අනුව සිදු කරනු ලැබේ. මේ සඳහා ඖෂධීය යුෂ, ද්‍රව්‍ය සහ සුවඳ තෙල් භාවිතයට ගනු ලැබේ.

රජතුමා අවුරුදු දිනයෙහි නිලධාරින් ඇතුළු පිරිස සමඟ ගොස් දළදා මැදුරෙහි විශේෂ වූ පූජා විධි පවත්වයි. ඉන් පසු ව අලුත් අවුරුදු උත්සවය නිමාවට පත් වේ.

# ක්‍රියාකාරකම්

01). මෙම පාඩම ශබ්ද නගා කියවන්න.

02). පහත දැක්වෙන වචනවල හිස්තැනට අකුරක් අඩු ය. පාඩම කියවා හිස්තැනට ගැළපෙන අකුර යොදා නැවත ඔබගේ අභ්‍යාස පොතෙහි ලියන්න.

i. ස් _____ නයක්
ii. සුවිශේ _____
iii. _____ කමය
iv. ඖ _____ධ
v. පරීක් _____
vi. _____ ථිරය
vii. ආ _____ ර්වාද
viii. _____ ජනය
ix. අනු _____ ව
x. ආහර _____

03). පහත දැක්වෙන වචනවලින් නිවැරදි ව අකුරු යෙදී ඇති වචනය තෝරා ඔබේ අභ්‍යාස පොතෙහි ලියන්න.

i ද්‍රව්‍ය/ද්‍රව්ය
ii රාජ්ජය/රාජ්‍යය
iii කාව්‍ය/කාව්‍ය
iv විද්‍යාලය/විද්ද්‍යාලය
v ශිස්‍ය/ශිෂ්‍ය
vi සාහිත්‍ය/සාහිත්‍යය
vii නාට්ට්‍ය/නාට්‍යය

04). පහත සඳහන් වචන හඬ නගා කියවන්න.

i ප්‍රවෘත්ති
ii චාරිත්‍රය
iii කෘතිය
iv කෘෂිකර්මාන්තය
v මිත්‍රයා
vi පත්‍රය
vii මුද්‍රණය
viii ඍජු
ix පෘථිවිය
x ශීඝ්‍ර

## භාෂා භාවිතය

01). වරහන් තුළින් නිවැරදි අක්ෂරය තෝරා හිස්තැන් පුරවන්න.

| | | |
|---|---|---|
| i | නිශ් ____බ්ද | ( ශ,ෂ,ස ) |
| ii | විශේ ____ | ( ශ,ෂ,ස ) |
| iii | පරීක්____ණය | ( ශ,ෂ,ස ) |
| iv | අ____රණ | ( ශ,ෂ,ස ) |
| v | ____ක්තිය | ( ශ,ෂ,ස ) |
| vi | ආදර්____ය | ( ශ,ෂ,ස ) |
| vii | කොට්ඨා____ | ( ශ,ෂ,ස ) |
| viii | පුරු____ | ( ශ,ෂ,ස ) |

02). පහත දැක්වෙන එක් එක් පේළිවල අකුරු නිවැරදි ව ලියා ඇති වචනයක් ද ඇත. එම නිවැරදි වචනය තෝරා ඔබගේ අභ්‍යාස පොතෙහි ලියන්න.

i ආරාධනාව, ආරාධණාව, ආරාදනාව

ii ලේඛණය, ලේඛනය, ලේකණය

iii ප්‍රශ්ණය, ප්‍රස්නය, ප්‍රශ්නය

iv පර්යේෂණය, පර්යේසනය, පර්යේෂනය

v ප්‍රතිපල, ප්‍රතිඵල, ප්‍රතිඵළ

vi ළිඳ, ලිඳ, ලිද

vii පිළිවෙල, පිලිවෙල, පිළිවෙළ

viii ප්‍රදර්ශනය, ප්‍රදර්සනය, ප්‍රදර්ශණය

03). හිස්තැනට සුදුසු වචනය වරහනින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

(ස්ථානය, ප්‍රසිද්ධ, ආභරණ, දක්‍ෂ, යුද්ධ)

i ඔහු ______________________ චිත්‍ර ශිල්පියෙක් විය.

ii සමහරු රට වෙනුවෙන් සේවය කිරීමට______________ හමුදාවට බැඳෙති.

iii ඇතැම්හු විවිධ දක්ෂතා නිසා රටෙහි________________ වෙති.

iv රිය අනතුර සිදු වූ _____________________ වංගු සහිත වූවකි.

v කාන්තාවෝ නොයෙක් __________________ පැළඳීමට රුචි වෙති.

04). පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කිරීම සඳහා වරහන් තුළින් ගැළපෙන වචනය තෝරා නැවත ඔබේ අභ්‍යාස පොතෙහි ලියන්න.

i ඔවුහු _______________ අවුරුදු උත්සවය පවත්වති. (අලුත් / අළුත්)

ii _____________________ උදව අප්‍රේල් මාසයේ දිනක සිදු වේ. (අවුරුධු/අවුරුදු)

iii රජතුමා ____________________ වේ. (සිංහාසනාරූඪ / සිංහාසනාරූඩ)

iv රජ වාසල ____________________ එලෙස ලැබුණු ද්‍රව්‍ය ගබඩාවට එකතු කළහ. (නිලමේවරු/ නිළමේවරු)

v ඔවුහු _____________ මාලිගාවේ පූජාවකට සහභාගි වූහ. (දලදා/ දළදා)

05). පහත සඳහන් වචන යොදා අර්ථවත් වාක්‍ය ඔබගේ අභ්‍යාස පොතෙහි ලියන්න.

| | | | |
|---|---|---|---|
| i. | ඖෂධ | vi. | වෂීාව |
| ii. | නෞකාව | vii. | සූයඞියා |
| iii. | භෞතික විද්‍යාව | viii. | කම්ාන්තය |
| iv. | රෞද්‍ර | ix. | වාතීාව |
| v. | ඌරා | x. | දුර්වල |

06). පහත සඳහන් වචන ඔබගේ අභ්‍යාස පොතෙහි ලියා ශබ්ද නගා කියවන්න.

| | | | |
|---|---|---|---|
| i. | ග්‍රන්ථය | vi. | පරීක්ෂණය |
| ii. | දක්ෂ | vii. | තීක්ෂ්ණ |
| iii. | යක්ෂයා | viii. | මහත්මා ගාන්ධි |
| iv. | විශේෂත්වය | ix. | පක්ෂය |
| v. | අක්ෂර | x. | අන්ධයා |

**පැවරුම්**

01. අතිරේක කියවීම

# ඒ කාලේ දිවුරූ හැටි

"අම්මාපල්ල මම නම් ඔය වැඩේ කළේ නැහැ."
"සත්තයි මම ඒකට සම්බන්ධ නැහැ."
"දෙවියන්පල්ල මම නිවැරදියි."

ආදි වශයෙන් දිවිරීම අද සමාජයේ වුව ද සාමාන්‍ය ව්‍යවහාරයක් බවට පත් ව තිබේ. බොහෝ විට මෙසේ දිවිරීමෙන් සපථ කරනු ලබන්නේ තමා යම් වරදකට සම්බන්ධ නොමැති බව ය. දිවිරීමෙන් කෙරෙනුයේ කියන දේ තවදුරටත් සනාථ කිරීමකි.

වර්තමාන අධිකරණ ක්‍රමයේ පවා දිවුරුමට සුවිශේෂ ස්ථානයක් හිමි වේ. සාක්ෂිකාරයා සාක්ෂි දීමට පෙර තම ආගම අනුව දිවුරයි. සමහර වැරදි නොකළ බව සපථ කරලීම සඳහා ප්‍රසිද්ධ ස්ථානවලට ගොස් දිවුරා එන ලෙස අද වුව ද අධිකරණය නියම කරන අවස්ථා ඇත.

අද පමණක් නොව, ඈත අතීතයේ ද දිවිරීමට වැදගත් ස්ථානයක් හිමි ව තිබුණි. රාජ ආණ්ඩු ක්‍රමයට අනුව සමහර නඩු රජ පෙළපතින් පැවත ආ නීති මගින් විසඳූ අතර සමහර නඩු දිවුරුම්වලින් විසඳූ බව පෙනේ. ඒ සඳහා එකල ව්‍යවහාරයේ පැවති දිවුරුම් ක්‍රම මෙන් ම වෙනත් දිවුරුම් ක්‍රම ද යොදා ගෙන තිබුණු බව පෙනේ.

අද මෙන් ම එදා ද සිංහල අධිකරණයේ සමහර නඩුහබ දිවුරුම් මගින් විසඳනු ලැබූ බව පෙනේ. ඒ සඳහා රජතුමා විසින් පත් කරන ලද නිලධාරීහු නොයෙක් පළාත් භාර ව සිටියහ. මෙම නඩු රැසක් ම විසඳනු ලැබුවේ විහාරයක දී හෝ දේවාලයක දී ය. එක් එක් පළාත් සඳහා ප්‍රසිද්ධ දේවාල තිබුණි. ඒ අතරින් ද ප්‍රමුඛ ස්ථානයක් ලැබුණේ මැද මහනුවර සතර මහා දේවාලයට ය. බොහෝ දිවුරුම් සිදු කළේ එහි දී ය.

රජු විසින් පත් කරන ලද නඩු විසඳන නිලධාරීහු නඩුවේ දෙපාර්ශ්වය ම දේවාලයට ගෙන්වා දිවුරවා තීරණයක් දුන්හ. ඔවුහු තමන්ට තීරණයක් දීමට නොහැකි වූ අවස්ථාවල තත්ත්වය මහරජතුමාට වාර්තා කළහ.

මෙම දිවුරුම් ක්‍රම ද එම නඩු අනුව වෙනස් වූයේ ය. වරදේ බරපතළකම වැඩි නම් දිවුරුම දරුණු විය.

උතුරන තෙල් කටාරමේ අත ඔබා දිවිරීම, රත් කළ යවට අල්ලා දිවිරීම, නාගමල්ලේ අත දමා දිවිරීම, වී ගැන දිවිරීම, දේවාලයේ දිවිරීම, කිතුල්ගසේ දිවිරීම, දරුවන් පිළිබඳ ව දිවිරීම, පොල්ගෙඩියේ දිවිරීම එකල පැවති දිවුරුම් ක්‍රම කිහිපයකි.

උතුරන තෙල් කටාරමක අත දමා දිවිරීම සෑම දේවාලයක ම සිදු වූයේ නැත. අනුහස් ඇතැයි සම්මත කතරගම, මහනුවර, දෙවුන්දර, සීනිගම, උණවටුන සහ සබරගමුව යන දේවාලවල පමණක් එය සිදුවිණ.

නියමිත දිනයට පෙර ද දිවුරුමට සූදනම් වන දෙපාර්ශ්වයේ ම පිරිස දේවාලයට පැමිණිය යුතු විය. එහි දී ස්නානය කර, සුදු පිළියෙන් සැරසී

තමාගේ නිරවද්‍යභාවය ලියූ තල්පතක් දෙවියන් ඉදිරියේ තැබිය යුතු විය. ඉන් පසු ව ආගමික වතාවත් සිදුකර දෙවියන්ට පින් දී "දෙවියෝ මට පිහිට වෙත්වා" යැයි කියා ආපසු පැමිණිය යුතු ය.

පසු දා උදෑසන ම දෙදෙනා යළි දේවාලයට පැමිණිය යුතු වූ අතර, ඒ වන විට පැමිණිලිකරු තමා විසින් සිඳගන්නා ලද නොඉඳුල් පොල්තෙල් බඳුනක් ද රැගෙන ඒම සිදු කෙරේ.

අදාළ නඩු විසඳන නිලධාරියා ද ඒ අවස්ථාවේ දේවාලයට පැමිණේ. දේවාලයේ කපුමහතා දෙවියන් ඉදිරියේ කන්නලව්වක් කිරීමෙන් පසු පැමිණිලිකරුවා ගෙන ආ පොල්තෙල් ද විත්තිකරුවා විසින් තමා ගෙන ආ ගොමදිය දහ තෙල් වෙන වෙන ම භාජනවල දමා ලිප්වල තබා, දෙහි දරවලින් ගිනි අවුළුවා කකාරවනු ලැබේ. තෙල් තාලිය හොඳහැටි නටන අවස්ථාවේ දී රාජ නිලධාරියා සහ කපුරාළ ඉදිරියේ දෙවියන් යදින විත්තිකරු මුලින් ම දකුණතේ දබරැඟිල්ල තෙල්වල බහා ඉන් පිටතට ගෙන ඊළඟට නටන ගොමදිය බඳුනේ ද ඔබයි. ඉන්පසු පැමිණිලිකරු ද එම ක්‍රමය ම අනුගමනය කරයි. යමෙකුගේ ඇඟිල්ල පිලිස්සුණේ නම් ඔහු වරදකරු වේ.

රත් කළ යවට අල්ලා දිවුරුමේ දී පැමිණිලිකරු සහ විත්තිකරු නියමිත දිනයේ දේවාලයට පැමිණෙති. ඒ දෙදෙන සමග නඩු විසඳීම භාර රාජපුරුෂයා සහ සේවකයෙක් ද පැමිණෙති.

සේවකයා පළමු ව පොල්කටු දමා, ගිනි මැලයක් සාදා ඒ තුළට යකඩ අලවංගුවක් දමා, ගිනියම් වන තුරු රත් කරයි. ඉන්පසු දෙවියන්ට කල් ඇති ව පේවී සිටින විත්තිකරු සහ පැමිණිලිකරු එතැනට කැඳවනු ලබන අතර, සේවකයා විසින් ගිනියම් වූ යකඩය අඬුවකින් රැගෙන ඒ අසල ඇති කෙසෙල් කොළයක් මත තබනු ලැබේ. ඉන්පසු නඩුවට සම්බන්ධ දෙදෙනා කෙසෙල් කොළ කැබැල්ලක් අත තබාගෙන යකඩයේ දෙකොනින් අල්ලා ගත යුතු වෙයි. මෙලෙස යකඩය ඔසවාගෙන නියමිත ස්ථාන හතකට එය රැගෙන යාමට ඒ දෙදෙනාට සිදු වේ. ඉන්පසු නිලධාරියා විසින් ඔවුන්ගේ අත් පරීක්ෂා කර බලනු ලබන අතර දෙදෙනාගෙන් අත පිලිස්සී තිබූ අය වරදකරු ලෙස සලකනු ලැබේ. අවසානයේ දී නිලධාරියා විසින් දෙවියන් ඉදිරියේ දී වරදකරුට දඬුවම් නියම කරනු ලබයි.

නාගමල්ලේ අත දමා දිවිරීම යනු විෂ සහිත නාගයෙකු සිටින මල්ලකට

දෙදෙනාගේ ම අත් දමා. “මා මෙය කළේ නැත. නැතිනම් දෙවියන් බලාගනියි'' ආදි වශයෙන් දිවුරන්නට සැලැස්වීමයි. යමෙකුට නාගයා දෂ්ට කරයි ද, හේ වරදකරු බවට පත් වේ.

ගොවියෙකුගේ වී තවත් අයෙකු ණයට ගෙන නියමිත දිනයේ නොගෙවා පැහැර හරී නම්, වී ගැන දිවිරීමට සිදුවේ. මෙලෙස පැමිණිල්ලක් ලැබුණු විට ගොවියාට දේවාලයට පැමිණීමට දිනයක් දන්වා ණයකරුට ද එදිනට දේවාලයට එන ලෙස නියෝග කෙරේ. ණයකරු තමා ණයට ගත්තා යැයි සඳහන් වී ප්‍රමාණය ද රැගෙන ආ යුතු වෙයි.

“මම කිසි දිනක මොහුගෙන් වී ණයට නොගත්තෙමි. යම් හෙයකින් මා කියන්නේ බොරුවක් නම් දෙවියන් සාක්කි''යි යනුවෙන් ණයකරු ප්‍රථමයෙන් ම දෙවියන් ඉදිරියේ තුන්වරක් පැවසිය යුතු වේ.

ඉන්පසු ගොවියා තමා ඉදිරියේ ඇති වී අතගා “මේ වී මගේ ය. මා කියන්නේ බොරුවක් නම් දෙවියන් සාක්කි''යි යනුවෙන් තෙවරක් කිව යුතු ය.

දිවිරීමෙන් පසු සියල්ලෝ ම ආපසු යති. දිවුරුමට ගත් වී නඩු විසඳන නිලධාරියා භාරයේ තබා ගැනේ. දින දාහතරක් තුළ දී මෙම දෙදෙනාගෙන් කෙනෙකුට යම් ව්‍යසනයක් සිදුවිය යුතු අතර එවිට ඔහු වරදකරු යැයි තීරණය කර අනිත් තැනැත්තාට අදාළ වී පිරිනැමේ.

දේවාලයේ දිවුරනවා යැයි කියන්නේ නියමිත දිනයක දෙදෙනා ම ප්‍රසිද්ධ දෙවොලකට පැමිණ දෙවියන්ට පූජා සත්කාර කර, තමාගේ හබය කියා තමා එයට සම්බන්ධ නැති බවට සහතිකවීමයි. “මා බොරුවක් පැවසී නම් දින හතක් තුළ දෙවියෝ මට අච්චු කෙරෙත්වා!'' යනුවෙන් දිවුරයි. මෙලෙස සතියක් ම කටයුතු කරනු ලබන අතර ව්‍යාජ ලෙස දිවුරූ අයට දේව දඬුවම් ලැබෙන බව විශ්වාස කෙරේ.

කිතුල් ගස් දිවිරීම සියල්ලට ම වඩා සංකීර්ණ වූවකි. පුරාණයේ පොල්ගස මෙන් ම කිතුල් ගස ද ශ්‍රී ලාංකිකයාට ඉතා ප්‍රයෝජනවත් ගසක් ලෙස සලකන ලදි. එබැවින් දෙදෙනෙකුගේ ඉඩම්වලට මායිම් ව කිතුලක් තිබුණොත් එයට දෙදෙනා ම උරුමකම් කියන්නට යෑමෙන් මහත් ආරවුලක් හට ගන්නේ ය.

නියමිත දිනයේ දෙදෙනා ම අදාළ කිතුල් ගස මුලට කැඳවනු ලබති. නඩුව විසඳන නිලධාරියා එක් අයිතිකරුවකුට මුට්ටියක් දී එය කිතුල් මලේ එල්ලන්නට අණ කරයි. ඔහු මුට්ටිය රැගෙන කිතුල් ගස මුලට පැමිණ ගසට වැඳ "දෙවියෝ මට පිහිට වෙත්වා!" යනුවෙන් කියා එම ගසට නැග මුට්ටිය එල්ලා බිමට බසී. එදින මුළු රැය ම ගස මුර කරනු ලබන අතර, පසුදා උදයේ මුට්ටිය ගසින් බා ගෙන්වා නඩුව විසඳන්නා එහි ඇති තෙලිදිය මට්ටම මැන බලයි.

ඊට පසුවදා දෙවන හිමිකරු ලවා ද ගසේ මුට්ටිය එල්ලා තෙලිදිය මට්ටම මැන ගනු ලැබේ. තෙලිදිය මට්ටම වැඩි ව තිබූ අය ගසේ හිමිකරු ලෙස ප්‍රකාශයට පත් කෙරේ. එක සමාන ව තෙලිදිය තිබුණේ නම් ගස දෙදෙනාට ම හිමි වේ.

එක් අයෙකුට අයිති දෙයක් අනිකෙකු සතුකර ගත්තා යැයි සඳහන් අවස්ථාවල දී දරුවන් පිළිබඳ දිවුරුම ද සිදු කෙරේ. නියමිත දිනයේ රාජපුරුෂයා ද සමග පැමිණිලිකරු හා විත්තිකරු නියමිත දේවාලයට පැමිණෙති. විත්තිකරුට තමාගේ බාල ම දරුවා ද රැගෙන එන ලෙස නියම කෙරේ.

විත්තිකරු මුලින් ම දෙවියන් වැඳ දිවුරුමට සූදානම් වේ. ඔහු තම දරුවා දෙවියන් ඉදිරියේ වඩාගෙන දරුවාගේ හිස මත ගල්කැට හතක් තබා අතින් තදකර මෙසේ කියයි.

"දෙවියනි, මම පැමිණිලිකරුට අයත් දේ කිසිවිටෙකත් නොගතිමි. ඒවා මට අයිති දේවල් ය. මා බොරු කියන්නේ නම් දෙවියෝ මගේ දරුවා හිසේ ඇති ගල්කැට ගණනට සමාන දින ගණනක දී මරත්වා!"

මෙසේ තෙවරක් කියා, ගල්කැට හත පැමිණිලිකරු අතට දී නික්ම යයි. සත් දිනක් ගතවන අතර දිවුරු තැනැත්තාට හෝ දරුවාට යම් මරණයක් සිදුවුවහොත් ඔහු වරදකරු වන අතර එසේ නැති වුවහොත් අනෙකාට තමා පැවසුවේ මුසාවක් බව පිළිගැනීමට සිදුවීමෙන් ඔහු දඬුවමට යටත් වෙයි.

පොල් ගෙඩියේ දිවුරුම, කුඹුරු පිළිබඳ අයිතිය කීමේ ආරවුල්වල දී සිදු කෙරෙන්නකි.

කුඹුරට අයිතිය පවසන දෙදෙනා ම කෙම්මුර දිනයක දී දේවාලයට කැඳවන නඩු විසඳන පුරුෂයා, දේවාලය ඉදිරිපිට මැස්සක් සාදා ඒ මත නැවුම් වළඳක් තබා එහි ලෙලි ගැසූ පොල් ගෙඩියක් තබයි.

මෙහි දී මුලින් ම දිවුරුම ආරම්භ කරන්නේ පැමිණිලිකරු ය. ඔහු මැස්ස උඩට නැග "දෙවියන් පල්ල මේ කුඹුර මගේ ය. එය .... ට හිමි නැත. මා කියන්නේ සත්‍ය ය. මා බොරු කියන්නේ නම්, දෙවියෝ මට සාප කරත්වා!" යි කියා දිවුරයි.

අනතුරු ව විත්තිකරු මැස්සට නැග, පොල්ගෙඩිය අතට ගෙන මුලින් දිවුරූ තැනැත්තා පැවසූ දේ ම කියයි. ඉන් පසු ව ඔහු පොල්ගෙඩිය ගෙන එය බිඳ "මා බොරු කියන්නේ නම් මේ පොල් මඳය විෂ වී මා මැරේවා!" යනුවෙන් කියා පොල් මඳය කයි. ඉන්පසු දෙපාර්ශවය ම ගෙවලට යන අතර සති දෙකක් ඇතුළත දී දෙදෙනාගෙන් එක් අයෙකුට විපත්තියක් වේ නම් ඔහු වරදකරු බව තීරණය කෙරේ.

මේ ආදි දිවුරුම් ක්‍රම රාශියක් එකල පැවතුණි. එසේ ම පුද්ගලයන් අතර ද නොයෙක් අවස්ථාවල දිවුරුම් සිදු කළ බව පෙනේ. එහෙත් මිනිසා සුචරිතවත් කිරීමට මහෝපකාරී වූ දිවුරුම් ක්‍රම විදේශ ආධිපත්‍යය නිසා කෙමෙන් මැකී යාම සිදු විය.